වෙළෙඳ දැන

# අලි මුහුදු ගියේ ඇයි?

2017 ජූලි 27

යවන්න



SRI LANKA NAVY

මුහුදට ගසාගෙන ගොස් දියඹේ අසීරු අඩියකට පත්ව සිටි අලින් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් බේරා ගනු ලැබූ අවස්ථා දෙකක් පසුගිය සති කිහිපය තුළ නැගෙනහිර ප්‍රදේශයෙන් වාර්තා විය.

ජූලි 12 වෙනි දින කෝකිලායි - කෝක්කුතුඩුවායි අසල මුහුදේ ගසාගෙන යමින් සිටි අලියෙකු බේරා ගැනීමට ශ්‍රී ලංකා නාවික හමුදාව සමත්වූ අතර, ජූලි 23 වෙනි දින තවත් අලි දෙදෙනෙකු බේරා ගැනුනේ ත්‍රිකුණාමලය අසල මුහුදේ අනතුරට ලක්ව සිටියදීය.

එම සිදුවීම් දෙකම දේශීය මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද දැඩි අවධානයට ලක් විය.

"අලි මුහුදට ආවේ සී බාත් ගන්නද? ඕස්ට්‍රේලියා යන්නද? " ආදී ලෙසින් ඒ පිළිබඳව හාස්‍යය මතුකරමින් සමාජ මාධ්‍ය ජාල ඔස්සේ අදහස් පළ වූ අතර, තවත් සමහරු එහි කිසියම් පාරිසරික හේතුවක් හෝ ස්වභාවික විපතක පෙරනිමිත්තක් ඇත්දැයි සංවාදයට ලක් කරන ආකාරයක් ද දක්නට ලැබුණි.

අලි මුහුදු ගියේ ඇයි? කෙටිකාලයක් තුළ එකම කලාපයක සිදු වූ මේ සිදුවීම් දෙක අතර සම්බන්ධයක් තිබෙන්නේ ද?





අලි මුහුදු යන්නේ ඇයි?

"මෙක ටිකක් අසාමාන්‍ය සිද්ධියක්. මීට පෙර එක අවස්ථාවක මේ වගේ සිදුවීමක් වාතර්‍ා වෙලා තියෙනවා. මීට අවුරුදු කිහිපයකට පෙර," වන සංරක්ෂණ සහ පයේර්ෂණ මධ්‍යස්ථානයේ සභාපති ආචායර් ප්‍රිතිවිරාජ් ප්‍රනාන්දු සඳහන් කළේ බීබීසී සිංහල සේවය මතු කළ එම ප්‍රශ්නවලට පිළිතුරු දෙමිනි.

ආචායර් ප්‍රිතිවිරාජ් ප්‍රනාන්දු විසිපස් වසරකට ආසන්න කාලයක් අලි

ඇතුන් පිළිබඳව පයෙර්ෂණවල නියැලී සිටින්නෙකි.

"දැන් තුන් වතාවක් මේ වගේ සිදුවීම් වාතර්ා වෙලා තියෙනවා," ඔහු පවසයි.

සබැඳි යොමු:

- "අලි මුහුදට ආවේ සී බාත් ගන්නද? ඕස්ට්‍රේලියා යන්නද ? "
- නාවික හමුදාව මුහුදේ ගිලුණු තවත් අලින් දෙදෙනෙක් බේරා ගනියි
- මුහුදේ ගසා ගෙන ගිය අලියා

මෙයින් වසර කීපයකට ඉහත අලි මිනිස් ගැටුමක් හේතුවෙන් යම්කිසි ප්‍රදේශයකින් ගෙනැවිත් නැගෙනහිර වනජීවී ප්‍රදේශයකට මුදා හැර තිබූ අලියෙක් ත්‍රිකුණාමල ප්‍රදේශයෙන් මුහුදට බැස පීනාගෙන යාමේදී නාවික හමුදාවෙන් බේරාගත් අවස්ථාවක් ඔහු සිහිපත් කළේය.

"මේ සිදුවීම් දෙකත් ඒ වගේ එකක්ද කියලා කියන්න අමාරුයි. පළවෙනි එක ,එහෙම අවස්ථාවක්ද කියලත් හිතෙනවා, මොකද? නාවික හමුදාවට අනුව පළවෙනි අලියා ගොඩක් දුර මුහුදේ ගිහින් තිබුණා. හෙම්බත් වෙලා හිටියේ බේරා ගනිද්දී. අනිත් කාරණේ ඒ අලියා ඒ ප්‍රදේශයේ හිටපු අලියෙක් නෙවෙයි කියලයි කිව්වේ."






මුහුදේ ගිලුණු තවත් අලි දෙදෙනෙක්

කෙසේ නමුත් දෙවන වරට බේරාගත් අලින් දෙදෙනා එම ප්‍රදේශයේ නිතර ගැවසෙන අලි දෙදෙනෙකු බව නාවික හමුදාව හඳුනාගෙන ඇති බවත් ඔහු සඳහන් කළේය.

බ්‍රිතාන්‍ය පාලන සමයේ අලින් ත්‍රිකුණාමල අවට දූපත්වලට පිහිනා ගිය අවස්ථා ඇති බවට වාතර්‍රා ඇති බව පැවසූ වන සංරක්ෂණ සහ පයෙර්ෂණ මධ්‍යස්ථානයේ සභාපති ,ආචාර්ය ප්‍රිතිවිරාජ් ප්‍රනාන්දු මෙම අලි දෙදෙනාද එලෙස ගමන් කරන්නට ඇති බවට විශ්වාස කළ හැකි බව අන්දහන් කළේය.

"දූපතකට පීනන්න ගිහිල්ලා, සැඩ පහරකට අහුවෙලා මුහුද මැදට ගහගෙන ගියා කියලා අපට සැකයක් තියෙනවා"

අලින්ට හොඳට පීනන්න පුළුවන්ද ?

"අලින්ට හොඳට පීනන්න පුළුවන්, ශරීරිය ලොකු නිසා නිසා හොඳට පාවෙනවා, හොඬවැල නිසා වතුරෙදි පහසුවෙන් හුස්ම ගන්නත් පුළුවන්."

කෙසේනමුත්, ඔවුන්ට පැය ගණනාවක් හෝ දින ගනනාවක් පිහිනිය නොහැකි බව පැවසූ ආචාර්ය ප්‍රිතිවිරාජ් ප්‍රනාන්දු, ඔවුන් බේරාගැනීමට නාවික හමුදාව කටයුතු කිරීම ඒ සතුන්ගේ භාග්‍යයක් වූ බවයි සඳහන් කළේ.

ඉහත කී සිදුවීම් දෙක සඳහා යම් පරිසර සාධක බලපෑවද යන්න ගැන පැහැදිලිව ප්‍රකාශයක් කළ නොහැකි බව පැවසූ ආචාර්ය ප්‍රිතිවිරාජ් ප්‍රනාන්දු, මේම සිදුවීම් දෙක එකිනෙකට සම්බන්ධ නැති සිදුවීම් ලෙස තමන් තවමත් සිතන බවත් කියා සිටියේය.

"නමුත් නැවතත් මේ වගේ අවස්ථාවක් වුනොත් අපිට විශේෂයෙන් ඒ ගැන හිතන්න වෙනවා"

ඉන්දියානු සාගරයේ 'අන්දමන්' දූපතෙන්ද අලි මුහුදේ පිහිනායමේ මෙවැනි සිදුවීම් වාතර්‍රා වී ඇතත් අලි මුහුදෙන් බේරාගැනීමේ සිද්ධීන් වාතර්‍රාවී ඇත්තේ ශ්‍රී ලංකවෙන් පමණක් බව තම අවබෝධය බවත් ඔහු පවසයි.

## සබැඳි විෂයයන්

- පරිසරය
- එක්සත් රාජධානිය
- ශ්‍රී ලංකාව





## මේ පුවත යවන්න මිතුරන්ට යැවීම පිළිබඳ

යළිත් උඩට

## මේ පුවතට සම්බන්ධ තවත් විස්තර

නාවික හමුදාව මුහුදේ ගිලුණු තවත් අලින් දෙදෙනෙක් බේරා ගනියි
2017 ජූලි 23

"අලි මුහුදට ආවේ සී බාත් ගන්නද? ඔස්ට්‍රේලියා යන්නද ? "
2017 ජූලි 25

මුහුදේ ගසා ගෙන ගිය අලියා
2017 ජූලි 12



Copyright © 2017 බී.බී.සී. බාහිර අඩවිවල අන්තර්ගතය සම්බන්ධයෙන් බීබීසියේ වගකීමක් නොමැත. බාහිර යොමු පිලිබඳ ප්‍රතිපත්තිය